චක්‍රලේඛ අංක 12/2010

මගේ අංකය ඩබ්/03/10
බන්ධනාගාර මූලස්ථානය, කොළඹ -9
20010-02-08

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර අධිකාරීන් වෙත,

## වැඩ සහන සහ කෙටි කාලීන ක්‍රම මත සිරකරුවන් සේවයෙහි යෙදවීම

වැඩ සහන ක්‍රමය සහ කෙටි කාලීන පදනම මත සිරකරුවන් බාහිර සේවා ස්ථානයන්හි යෙදවීම සම්බන්ධව මවිසින් නිකුත් කරණ ලද අංක 32/2000 දරණ 2000-08-10 සහ 58/2006 දරණ 2006-12-08 දිනැති චක්‍රලේඛ වලට අමතරවයි.

වැඩ සහන ක්‍රමය සහ කෙටි කාලීන පදනම මත සිරකරුවන් සේවයෙහි යෙදවීමේදී එම සිරකරුවන් සඳහා සේවා යෝජකයින් විසින් දැනට ගෙවනු ලබන රු.220/- දෛනික වැටුප රු.300/- දක්වා වැඩි කිරීමට තීරණය කර ඇති බැවින් පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරණ ලෙස දන්වමි.

1. සිරකරුවන් සේවයෙහි යොදවන සියළු ආයතන අමතා 2010 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත සඳහන් පරිදි වැඩිකල වැටුප් ගෙවන ලෙසත්, දිවා ආහාර සහ තේ පැන් සේවා ආයතනයෙන් සැපයීමේදී එක් සිරකරුවෙකුට ගෙවන රු.300/- වැටුපෙන් රු.100/- බැගින් අඩු කර වඩාත් ප්‍රමිතියකින් යුත් දිවා ආහාර සහ තේ පැන් සපයන ලෙසත් සේවා යෝජකයින්ට දන්වන්න.

2. වැඩි කල වැටුප් පහත සඳහන් පරිදි බෙදා වෙන් කිරීමටත්, ඉහත සඳහන් චක්‍රලේඛ අනුව දී ඇති උපදෙස් ප්‍රකාර කටයුතු කරීමටත් වගබලා ගත යුතුය

### වැඩ සහන ක්‍රමය මත සේවයෙහි යොදවන සිරකරුවන් සඳහා (දීර්ඝ කාලීන සේවා)

| | |
|---|---|
| දෛනිකව සිරකරුවෙකුට අයකල යුතු මුදල | රු.300.00 |
| දිවා ආහාර සහ තේ සඳහා අඩු කිරීම | රු.100.00 |
| ඉතිරිය | රු.200.00 |

| | | |
|---|---|---|
| රජයේ ගිණුමට අඩු කිරීම | 10% | රු. 20.00 |
| සිරකරු සුබසාධක අරමුදලට අඩු කිරීම | 10% | රු. 20.00 |
| සිරකරුට ගෙවිය යුතු මුදල | 80% | රු.160.00 |

2.1 විශ්‍රාමික නිළධාරියෙකුට දැනට ගෙවන රු: 400/- දෛනික දීමනා ගෙවීම සහ සෙසු උපදෙස් එපරිදිම ක්‍රියාත්මක කල යුතුය.

### කෙටි කාලීන සිරකරුවන් සඳහා

| | |
|---|---|
| දෛනිකව සිරකරුවෙකුට අයකල යුතු මුදල | රු.300.00 |
| දිවා ආහාර සහ තේ සඳහා අඩු කිරීම | රු.100.00 |
| ඉතිරිය | රු.200.00 |

| | | |
|---|---|---|
| රජයේ ගිණුමට අඩු කිරීම | 10% | රු. 20.00 |
| සිරකරු සුබසාධක අරමුදලට අඩු කිරීම | 10% | රු. 20.00 |
| නිලධාරී ත්‍යාග අරමුදලට අඩු කිරීම | 10% | රු. 20.00 |
| සිරකරුට ගෙවිය යුතු මුදල | 70% | රු.140.00 |

2.2 නිළධාරියෙකුට දැනට ගෙවන රු: 400/- දෛනික දීමනා ගෙවීම සහ සෙසු උපදෙස් එපරිදිම ක්‍රියාත්මක කල යුතුය.

3. මෙකී සේවාවන්හි යොදවන සිරකරුවන් සඳහා සේවා ආයතනයෙන් ප්‍රවාහණ පහසුකම් සැපයීම අනිවාර්යයෙන් සිදු කල යුතු බව සේවා ආයතන වලට දන්වා ඉදිරි පියවර ගන්න.

වී.ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිජී
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්